සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

**11 ශ්‍රේණිය** # නර්තනය **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජු නර්තනය දැක්වීම සඳහා ඉදිකළ ස්ථානය වන්නේ,
(1) සත්මහල් ප්‍රාසාදය (2) නිශ්ශංකලතා මණ්ඩපය
(3) සරස්වතී මණ්ඩපය (4) ලෝවාමහා ප්‍රාසාදය

02 ''ලකල පුළුලු කුල බැඳ මිණි මෙවුල්ලා.....'' නර්තනය පිළිබඳව මෙම ගායනය ලියැවී ඇත්තේ,
(1) සැළලිහිණි සංදේශයේ (2) සැවුල් සංදේශයේ
(3) පරවි සංදේශයේ (4) හංස සංදේශයේ

03 උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ගැමි නාටක ලෙස හඳුන්වන්නේ,
(1) කෝලම් හා නාඩගම් (2) සොකරි හා රූකඩ
(3) සොකරි හා කෝලම් (4) අනුරූපණ හා සොකරි

04 පංචතූර්ය වාදනයට අනුව ආතත හා විතතාතත වර්ගයට අයත් වන්නේ,
(1) යක් බෙරය හා ගැට බෙරය (2) යක් බෙරය හා දවුල
(3) ගැට බෙරය හා රබාන (4) උඩැක්කිය හා තම්මැට්ටම

05 වෙස් ඇඳුම් කට්ටලයට අයත් කොටස් ලෙස දැක්විය හැක්කේ,
(1) හගල, පායින්පත, අවුල්හැරය (2) පායින්පත, කාගුල්, සේලය
(3) හගල, සේලය, අවුල්හැරය (4) හැඩකැල්ල, කෙමෙත්ත, පායින්පත

06 දෙවොල් මඩු පුරාවෘත්ත කතාව හා සම්බන්ධ වන්නේ,
(1) මලය රජු හා පත්තිනි (2) ශක්‍ර දේවේන්ද්‍ර හා පඬුවස් දෙව්
(3) ඊශ්වර හා සදලිඳු (4) පත්තිනි හා සේරමාන්

07 ''සොලොසා සංබය පළමුව පෙරුම් පිරූ බලයෙන් දා....'' මෙම කවිය,
(1) නානුමුර කවියකි. (2) සිරසපාද කවියකි. (3) මල් යහන් කවියකි. (4) ආශිර්වාද කවියකි.

08 කස්තිරම, ඉරට්ටිය හා කලාසම යන වචන අනුපිළිවෙලින් මෙම සම්ප්‍රදායට අයත් ය,
(1) උඩරට, සබරගමු, පහතරට (2) උඩරට, පහතරට, ද්‍රවිඩ,
(3) උඩරට, පහතරට, සබරගමු (4) උඩරට, ද්‍රවිඩ, සබරගමු

09 ගැමි නැටුමක විශේෂ ලක්ෂණ වේ,
(1) සරල බව හා සාම්ප්‍රදායික බව (2) ශාස්ත්‍රීය බව හා උපකරණ භාවිතය
(3) සරල බව හා උපකරණ භාවිතය (4) සාම්ප්‍රදායික බව හා උපකරණ භාවිතය

10 සම් වර්ග යොදා ගනිමින් නිපදවා ඇති භාණ්ඩ හඳුන්වන්නේ,

(1) තත් භාණ්ඩ (2) අවනද්ධ භාණ්ඩ (3) තාල භාණ්ඩ (4) ආතත භාණ්ඩ

11 නර්තනයේ දී දැකිය හැකි ........................ අයත් වන්නේ, වාචික හා තාත්වික අභිනයට ය.

(1) ගීත ගායනය හා භාව ප්‍රකාශනය. (2) ගායනය හා වාදනය.

(3) ගීත ගායනය හා නර්තනය. (4) වාදනය හා රංග වස්ත්‍රාභරණ.

12 කෝලම් වල හා සොකරි නාටකයේ එන චරිත වශයෙන් ........................ හඳුන්වනු ලැබේ.

(1) ආරච්චි, හෙන්ඩා සහ ආඩිගුරු, අණ බෙර කරු

(2) විදානේ, කාලි සහ ආඩිගුරු, පරයා

(3) ලෙන්චිනා, ආරච්චි සහ ආඩිගුරු, සොකරි.

(4) ලෙන්චිනා, වෙදරාල සහ සොකරි, පරයා

13 ශ්‍රී ලංකාවේ වෘත්තීන් හා බැඳී ඇති ගැමි නැටුම් ලෙස හැඳින්විය හැක්කේ,

(1) ගොයම්, කුළු, කලගෙඩි (2) ගොයම්, කුළු, මෝල්ගස්

(3) සවරං, චාමර, ගොයම් (4) සවරං, කුළු, ලී කෙළි

14 බලි ශාන්ති කර්මය ........................................................................ වෙනුවෙන් පවත්වනු ලබයි.

(1) දෙවියන් (2) රජවරුන් (3) යකුන් (4) ග්‍රහයින්

15 ශ්‍රී ලංකාවේ පවතින නර්තන සම්ප්‍රදායන් අතුරෙන් ............................... සාම්ප්‍රදායේ විවිධ වූ රංග වස්ත්‍රාභරණ දක්නට ලැබේ.

(1) භාරත නාට්‍යම් (2) සබරගමු (3) පහතරට (4) උඩරට

16 කෝලම් රඟ මඩල ........................................................................................ නමින් හඳුන්වයි.

(1) තානායම් පොළ (2) කරලිය (3) වේදිකාව (4) කමත

17 මාත්‍රා 3 + 4 දෙතතිට සහ මාත්‍රා 4 තනි තිතට ..................... යන වන්නම් නටනු ලබයි.

(1) තුරඟා සහ හනුමා (2) තුරඟා සහ වෛරොඩි

(3) නෛඅඩි සහ සිංහරාජ (4) හනුමා සහ සැවුලා

18 කෝලම් නාටකයේ පුරාවෘත්ත කතාව හා සම්බන්ධ වන්නේ ................................... බිසවයි.

(1) සේරමාන් රජ (2) මලය රජ (3) මහා සම්මත රජ (4) පඬුවස් දෙව් රජ

19 ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියන් ලස්සනට නටත්. ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකය වැඩ දැමූ වස්ත්‍ර ඇත.'' මෙය පවසා ඇත්තේ,

(1) ඉබන් බතූතා (2) ස්පිල් බර්ජන් (3) රොබට් නොක්ස් (4) ජෝන් ඩේවි

20 කතක් නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) තබ්ලාව (2) පක්වාජ් (3) මෘදංගය (4) කෝල් බෙරය

21 භාරත නාට්‍යම් ගී තාල වාද්‍ය භාණ්ඩය වාදනය කරන්නේ,

(1) ගුරුවරයා (2) පොන්නානි (3) නටුවනාර් (4) ගුංගුරු

22 කතක් නර්තන ප්‍රසංගයක එන නර්තන අංගයක් වන්නේ,

(1) ආලාරිප්පු (2) සාරංගි (3) තාල පද (4) සලාම්

23 පිළිවෙලින් උඩරට, පහතරට, සබරගමු රංග වස්ත්‍රාභරණ කට්ටල වලට අයත් වන්නේ,

(1) අවුල් හැරය, තෙල් තාච්චිය, පබලු හැට්ටය (2) කාසි මාලය, ගුංගුරු, පබලු හැට්ටය

(3) අවුල් හැරය, සිලම්බු, කාසි මාලය (4) හගල, කාගුල් තොප්පිය, තෝඩුපත්

24 කර්ණාටක සංගීත සම්ප්‍රදායේ එන අවනද්ධ වාද්‍ය භාණ්ඩයකි,

(1) උඩැක්කිය (2) තබ්ලාව (3) කෝල් බෙරය (4) මෘදංගය

The National e-learning Portal for the General Education

25 උඩරට නර්තන සම්ප්‍රදායේ ශිල්පීන් දෙදෙනෙකු මුහුණට මුහුණලා කරන සුවිශේෂී වාදන අංගයකි,
(1) පින් බෙර (2) අත්‍යා බෙර (3) දකුම් අත් (4) හඬ බෙර

26 වාචික අභිනයෙන් තොරව නර්තනය හා සංගීතයෙන් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය විශේෂය වන්නේ,
(1) ගීත නාට්‍ය (2) ශෛලිගත නාට්‍ය (3) මුද්‍රා නාට්‍ය (4) ස්වාභාවික නාට්‍ය

27 මෙම නාට්‍ය අතරින් ගීත නාට්‍යයක් වන්නේ,
(1) කරදිය (2) දෙපානෝ (3) කැළණි පාලම (4) නරි බෑණා

28 උඩරට නැටුම් පිළිබඳ පොත්පත් රාශියක් ලියූ ප්‍රවීණ ශිල්පියෙකු වන්නේ,
(1) නිත්තවෙල ගුණයා මහතා (2) සව්රිස් සිල්වා මහතා
(3) ජේ. ඊ. සේදරමන් මහතා (4) එස්. පණීභාරත මහතා

29 සබරගමු නැටුම් ප්‍රවර්ධනයට දායකත්වය සැපයූ ප්‍රවීණ ශිල්පියෙකු වන්නේ,
(1) එන්. ඒ. සිරිබෝහාමි මහතා (2) එස්. පණීභාරත මහතා
(3) කේ. එස්. ප්‍රනාන්දු මහතා (4) නිත්තවෙල ගුණයා මහතා

30 මුරුගන් දෙවියන් සිහිපත් කිරීම සඳහා ඉදිරිපත් කරන නැටුමක් වන්නේ,
(1) කාවඩි (2) කෝලාට්ටම් (3) සුලකු (4) සෙම්බු

31 ගැට බෙර වාදනයට පමණක් සුදුසු වන බෙර පදයකි,
(1) දොං දොං ගජිං ජිගත (2) ජේන කිට කිටිතක
(3) රුදකිට තත් දොම් (4) ගුංද දෙගත ගදිගත ගුද

32 මේවා ගැට බෙරයට අයත් කොටස් වේ,
(1) කැපුම් හම, වෙනිවර කැරැල්ල, හයි තට්ටුව (2) සුරත් තට්ටුව, වෙනිවර කැරැල්ල, වරපට
(3) වරපට, වෙනිවර කැරැල්ල, හයි තට්ටුව (4) ඉල්ලම්, සුරත් තට්ටුව, බෙර කට

33 උඩරට වන්නම් රචනා කළේ,
(1) පරාක්‍රමබාහු රජු කල අන්ධ බ්‍රාහ්මණයෙකු විසින්.
(2) කීර්ති ශ්‍රී රාජසිංහ රජු කල ධම්ම රක්ඛිත නම් හිමි නමක්.
(3) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු කල ගණිතාලංකාර නම් බමුණෙක් විසින්.
(4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කල රම්මොලවක අධිකාරම විසින්.

34 උඩරට වන්නමක අන්තර්ගත කොටස් ගණන,
(1) හතරකි (2) තුනකි (3) හයකි (4) පහකි

35 ''කුදාංත ගත දොං වට්ටම'' අයත් වන්නේ,
(1) 2 + 3 තිතට (2) 2 + 2 + 4 තිතට (3) 2 + 2 + 3 තිතට (4) 3 + 4 තිතට

36 ''තාම් දොමිත ගත....... කඩතක තරිකිට..... කිත් තක් කුද කුද' මෙහි හිස්තැන් වලට ගැළපෙන පද වන්නේ,
(1) ගත කුද දත් කඩ තක තරිකිට (2) කිත්තක් කිතක දොම් ති ගත
(3) තාකු ජිත්ත ගත දොම් කිට (4) දොම් කිට කිතක දොමිති ගත

37 කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරු වේ,
(1) කොහොඹා තුන් කට්ටුව, වීර මුණ්ඩ දෙවි (2) කොහොඹා දෙවි, දෙවොල් දෙවි
(3) බණ්ඩාර දෙවිවරු, මංගර දෙවි (4) කොහොඹා දෙවි, විෂ්ණු දෙවි

38 කොහොඹා කංකාරියට කියන තවත් නමකි,
(1) ගැට පස් මංගල්‍යය (2) කඩවර කංකාරිය
(3) සූනියම් යාගය (4) වලියක් මංගල්‍යය

39 ''නාට්‍ය ශාස්ත්‍රය'' නමැති සංස්කෘත ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) නන්දි ෂේෂ්වර (2) භරතමුණි
(3) දෙවන පරාක්‍රමබාහු රජු (4) ගණිතාලංකාර

40 ''හංස විල'' මුද්‍රා නාට්‍යය නිෂ්පාදනය කළ රට කුමක් ද?
(1) ඉතාලිය (2) ඉන්දියාව (3) ප්‍රංශය (4) රුසියාව

(ළ. 40 යි.)

The National e-learning Portal for The General Education

# II කොටස

● **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 (1) මාත්‍රා 04 තිතට අයත් වන්නමක් නම් කරන්න. (ල.01)

(2) රජවරුන් වර්ණනා කිරීමට ගායනා කළේ මොනවා ද? (ල.01)

(3) සම්ප්‍රදායන් තුනටම පොදු ශාන්ති කර්මය නම් කරන්න. (ල.01)

(4) වන්නි ප්‍රදේශයේ ප්‍රචලිත ගැමි නාටකයක් නම් කරන්න. (ල.01)

(5) මණ්ඩියට සිටීමේ සම්මත දුර ප්‍රමාණය කොපමණ ද? (ල.01)

(6) උත්තර භාරතීය නර්තන සම්ප්‍රදායන් 02 නම් කරන්න. (ල.01)

(7) පණීභාරත මහතා නිපදවූ මුද්‍රා නාට්‍ය 02 නම් කරන්න. (ල.01)

(8) හංස විල මුා නාට්‍යයට සංගීතය සැපයුවේ කවුද? (ල.01)

(9) කතක් නර්තනයේ සරානා 04 නම් කරන්න. (ල.02)

(10) තාන්ජාවුර් සහෝදරයන් 04 නම් කරන්න. (ල.02)

02 සැවුලා වන්නමේ බෙර පදය, කවි පද 02 ක් හා කස්තිරම නියමිත තාල රූපයට අනුව ප්‍රස්ථාර කරන්න. (ල.12)

03 (1) දේශීය වාද්‍ය භාණ්ඩ 04 ක් නම් කරන්න. (ල.02)

(2) නර්තන අවස්ථාවෙන් බැහැරව ඒවා යොදාගන්නා අවස්ථා සඳහන් කරන්න. (ල.04)

(3) ඔබ ඉගෙනගන්නා නර්තන සම්ප්‍රදායට අයත් භාණ්ඩය රූප සටහනක දක්වා කොටස් නම් කරන්න. (ල.06)

04 (1) මහනුවර යුගයේ දේශාටක වාර්තා 02 ක් නම් කරන්න. (ල.02)

(2) ඒවායේ ඇතුලත් කරුණු කෙටියෙන් දක්වන්න. (ල.04)

(3) එමඟින් නර්තන කලාව පිළිබඳ ගත හැකි නිගමන මොනවා ද? (ල.06)

05 පහත මාතෘකා අතරින් 03 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(1) වන්නම්

(2) ප්‍රශස්ති

(3) ඉලංගම් සරඹ

(4) බීජාක්ෂර (ල.12)

06 (1) කර්ණාටක සංගීතය භාවිතා කරන භාරතීය නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න. (ල.04)

(2) ඉන් එකක් පිළිබඳව විස්තර ඉදිරිපත් කරන්න. (ල.08)

07 ''ජන මාධ්‍ය මඟින් දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනයට මහඟු සේවයක් ඉටු කරයි.'' විමන්න. (ල.12)

The National e-learning Portal for The General Education